

# කොරටුවෙගෙදර අප්පුහාමිගෙ හෑල්ල

*ගෑනු වයසට ගියාම පිං එක්කහු කරන්නෙ ටොං හොන්ඩරවලිං.*

**කලින් දවසේ** පිරිත් ගෙදර ගිහිං එන කොට හුඟක් රෑ බෝ වෙලා තිව්නා. ඒක හින්දා පස්සෙන්දෝ ටිකක් වැඩිපුර නිඳා ගත්තා. ඒක පිරිත් ගෙදරක් නෙවි මඟුල් ගෙදරයක්. පිරිත් අහන්න ආපු හැම දෙනාටම රෑ කෑම පැයෙම් පැයට තේ කෝපි, කැවිං කොකිස්, විස්කෝතු, කෙහෙල් ගෙඩි එක්ක. මට නං පිරිත් හරියට හින්දි සින්දු ගානයි. මොකෝ එක පාලි වචනෙකවත් තේරුම දන්නවයැ මං ෟ සිරියාවතී හාමිනේ නං හරි මනාපයි පිරිත් අහන්න. ඒ මහගෙත් දන්න පාලි යක්නං නෑ. ඒ උනාට පිරිත් මන්ඩපේ ලඟිම්ම වාඩිවෙලා දෑස් දෙකම.... නෑ නෑ මට වැරදුනා....ඇස් දෙක පියාගෙන පිරිත් ඇහුවා.

ගෑනු වයසට ගියාම පිං එක්කහු කරන්නෙ ටොං හොන්ඩරවලිං. පස්සෙන්දා පාන්දර මං ඇහුවා ''සිරියාවතී හාමිනේ ලබන ජාතියෙ පිරිමියෙක් වෙලා උපදින්නයි කල්පනාව නෙහ් ෟ කියලා.''

''ඇයි එහෙම ඇහැව්වේ?''
''නෑ මට නිකමට හිතුනා පිරිමි වෙන්න තරං පිං කරලා නැති ඇත්තොලු නේ ගෑනු වෙලා උපදින්නෙ. ඒක නේ ගෑනු බුදු වෙන්නැත්තේ ෟ''
''අපොයි ඔව්. මට නං මේ ගෑනුකම එපාම වෙලා. ගෑනු අපි කොහොම කොලත්, කොහොඹ කොල වගේ පිරිමි හතර පස් දෙනෙක් කරන වැඩ අපි ගෙදර ඉඳං තනියෙං කරනවා. ඒත් ඉතිං පිරිමි හිතං ඉන්නේ...''

''හප්පා...ආ ඇති ඇති සිරියාවතී හාමිනේ ඕකට උදහස් වෙන්න කාරි නෑ. ලබන ජාතියෙ ගෑනියෙක් වෙලා උපදින්නංකො. එතකොට ගනුදෙනුව හිලව් වෙන හින්දා ඔහේ ඕවා ගනං ගන් නැතුව ඉන්නකො. ඔහේ ලබන ජාතියෙ පිරිමෙක් උනාම අපි දෙන්නා ආයිත් එකම..''

''එපා එපා... අප්පොච්චියෝ එපා. අප්පුහාමිගෙ මනමාල කමනං තාම ඇරුනෙ නෑ. මං ලබන ජාතියෙ පිරිමියෙක් උනත් අනගාරිකයෙක් වෙනවා. ඒක හින්දා අප්පුහාමි දැං ඉඳලාම වෙනිං කව්රු හරි හො... හොයා...''

''ආ... එහෙමද හරි හරි .... මං අද ඉඳලා ම ඒ ගැන හිතන්නංකො. මං ඉක්මන්ටම කව්රු හරි කැන්දං එන්නං. සිරියාවතී හාමිනේ හොඳ ලමයා වගේ උන්දෑට ගෙදර දොරේ වැඩ ටිකක් පුරුදු කරන්න. උන්දැටත් මගේ කාමරේම රෑට නිදා ගන්න...''
''අ.......හා...... මා වලක වැටී ඇත. වැඩිය දඟලා මඩ නා ගන්නේ නැතිව ඒ වලේ කටිම්ම ගොඩට පැන ගත යුතුය.''
''තේ වතුර තිබහෙ (පිපාසෙ) දිව ගිලෙන්න යනවා සිරියාවති හාමිනේ හොඳ ලමයා වගේ තේ කහට එකක් වක්කරගෙන එන්නකො. ඒක බිබීම කතා කරන්න බැරිය ෟ ඊයේ ගෙනා කිතුල් හකුරු මුල හොඳ ද දන්නෑ. දැං කිතුල්මල්වලිං බේරෙන්නෙ උක් තෙලිජ්ජ. ඒක හින්දා කිතුල් හකුරුත් උක් හකුරු රහයි.''

සිරියාවතී හාමිනේ කතාවක් බහක් නැතුව කුස්සිය පැත්තට ගියාය. ''යාන්තං බේරුනා'' මට ඉබේ ම කියවිනි. වලෙං ගොඩ ආවාක් මෙන් මට දැනුනි. අපේ සිරියාවතී හාමිනේ නේද, අම්මෝ ඇරි ඇරි අතක් නෑ. කට ඇවිස්සුනොත් ඉවරෙටම ඉවරයි. බාබර් සාප්පුවෙ කතුර පරාදයි. ඔන්න බොලේ උලු ගෙදරවත්තෙ ආනන්ද මේ පැත්තට එනවා. මොකක් ද.... අ...

හදිස්සියක් පාටක් නං පේන්නෑ.
''ආයුබොවං ආනන්ද මහත්තයා ආයුබෝවං. බොහෝම කාලේකිං....එන්ඩ එන්ඩ ඉඳ ගන්නකො ඔය බාජනෙං''
''අප්පුහාමි මාමා දැක්කෙ දෙතුම්මාසෙකිං.''
''වෑ...ඩියි.. මට හිතෙන්නෙ මාස පහක් හයක් විතර... ආනන්ද මහත්තයා ඩිංගක්

*අනේ ඔව් අප්පුහාමි මාමා, මඟ රැඳුන අද තෝ නසී, ගෙට ගිය අඹුව නසි වගේ උබතෝකෝටික ප්‍රස්නයක්. මමා දන්නැතුව ඇති අපේ මාලිනීලෑ අම්මා දැං අපේ ගෙදර ඇවිත් සුමාන දෙකකටත් වැඩී. බබා හම්බ වෙන්න කිට්ටු හින්දායි මාලිනී අම්මාව ගෙන්න ගත්තෙ. දැං උන්ද මට මහ වදයක් වෙලා.*

කෙට්ටු වෙලා වගේ ෟ ''
''ඒ අප්පුහාමි මාමාට පේන හැටි. මීට මාස හතරකට කලිං මං කිලෝ තුනක් අඩුයි.''
''හැබෑද ෟ මට මතක තිබුනෙ ඔයිට වැඩිය මහතට හිටියා වගේ. හැබෑට මොකද අද මේ පැත්තේ?''
''පොඩි ප්‍රස්නයක්. ඒකයි මහවිසද පන්ඩිතයො හම්බ වෙන්නාවෙ. උපදේසයක් ගන්න.''
''උපදේසයක්ද? එහෙනං කලිම්ම එකක් කියන්න තියනවා. දැම්මං පෙරකදෝරුකං කරන්නෙ අය කරලා. මහවිසද පන්ඩිතයන්ට රජ්ජුරුවංගෙ බාන්ඩාගාරෙං මසුරං ලැබුනා නේ ෟ ''

''අපෙ අප්පෝ ආනන්ද මහත්තය දැකපු කල් ෟ'' සිරියාවතී හාමිනේ කහට කෝප්පයක්ද අතැතිව එතනට ආවා ය.
''මාත් ඒකට සාක්කි. අප්පුහාමි දැං කිසි දෙයක් කිසි ම කෙනෙකුට නිකං කරන්නෑ. හැම එකටම අය කරනවා. බොහොම ගනං.''
''ලඟක ඉඳලා වෙන්ටෑ, නේද නැන්දෙ?''
''ඔව්වොව්. ලඟක ඉඳලා නං තමයි. මට උනත් එහෙමයි. කිසිම දෙයක් නිකන් නෑ'' ආනන්ද හිනාඋනා මිසක් ඒ කතාවට උඩගෙඩි දුන්නෑ. සිරියාවතී හාමිනේ යලි ගේ තුලට යමින් ''මං ආනන්ද මහත්තයාටත් කහට කෝප්පෙයක් ගේන්නංකො හකුරුත්තෙක්ක''යි කීවාය.

''හැබෑට මොකද ආනන්ද මහත්තයා ප්‍රස්නයක්ය කීවේ?
''අනේ ඔව් අප්පුහාමි මාමා, මඟ රැඳුන අද තෝ නසී, ගෙට ගිය අඹුව නසි වගේ උබතෝකෝටික ප්‍රස්නයක්. මමා දන්නැතුව ඇති අපේ මාලිනීලෑ අම්මා දැං අපේ ගෙදර ඇවිත් සුමාන දෙකකටත් වැඩී. බබා හම්බ වෙන්න කිට්ටු හින්දායි මාලිනී අම්මාව ගෙන්න ගත්තෙ. දැං උන්ද මට මහ වදයක් වෙලා. මාලිනීත් අසරන වෙලා. අම්මා අමනාපවෙලා ගියොත් ලොකු කරදරයක්. ඔන්න මොකක් හරි උවමනාවකට මාමා මං හම්බ වෙන්න ආවයි කියමුකො. උන්දැත් එනවා පත්තරේ හරි පොතක් හරි අරගෙන එතෙන්ට. ඊලඟට බලෙම්ම අපේ කතාවට හවුල් වෙනවා. අපට අපේ කතාව කරන්න නෑ. මගේ යාලුවෙක් ඊයෙ ආපහු ගියේ අමනාපෙං වගේ. ''අපි වෙනින් දවසක වෙනින් තැනකදි කතා කරමු' යි කියා ගෙන.

''පුටු දෙකක් අරං මිදුලෙ අඹ ගහ යටට ගියාම ඉවරනේ ෟ''

''අප්පුහාමි මාමාටයි මටයි එහෙම පුලුවං. ඒ උනාට බැංකුවෙ මාත් එක්ක එකට වැඩ කරන යාලුවෙක් ආවාම එහෙම කරන්න පුලුවනෑ. ඔව්ං මොනවාද නොහිතන්නෙ?''
''හරි මට තේරුනෝ දැං ආනන්ද මහත්තයා යන්න'' මං පැයකිං එහේ එනවා.''
''මාමා.... එ...එහේ... එනවා... පැ...පැයකිං...අපේ එපා අපි ඉවරයි. අම්මා අකුල ගෙන අදම යාවි.''

''නෑ...නෑ... ආනන්ද යන්න. මං එහෙම ගොං වැඩ කරන්නෑ. කිසි අමුත්තක් නැතුව ගෙදර යන්න. අම්මාටත් ඇහෙන්න කියන්නකො මං හම්බ වෙන්න ගියාම පොඩි ගමනක් ගිහිං මං පැයකිං විතර මෙහේ එනවයි කියලා. මං ගෙදර යන්න කීවාය කියලා.

සිරියාවතී හාමිනේ ගෙනා කහට කෝප්පය උගුරට දෙකට හිස් කල ආනන්ද අපෙන් සමු ගත්තේය.

''ඔහේ දැං ආනන්දලෑ ගෙදර යන්න ද?''
''ඔව් මං එහේ ගිහිං සිරියාවතී හාමිනේගෙ පතුරුයන්න බනිනවා.''

''ම....මි...මට? මං අහවල් වැරැද්දක් කොලාටයෑ.. මං බනින් නේ ?''
''ඇයි ඔහේ කිව්වෙ ලබන ජාතියෙ ඔහේ අනගාරික වෙන හින්දෝ මට වෙනිං අතක් බලා.....''
''ආ....ආ.... ඒක ද?''

''ඒකම නෙවි, අපට කතා කරන්න නැතුව ඔහේ එතෙන්ට ආවාම අපේ කතාව නවත්තලා ඔහෙත් එක්ක කතා කර කර ඉන්න වෙන හින්දාය මං ආනන්දට ගෙදර යන්න කිව්වේ. පස්සෙ අපේ කතාව කරන්න හිතා ගෙන කියලා අම්මාට ඇහෙන්න මං ආනන්දට කියනවා, ඔහේ හැමදා මත් එහෙමයි කියලා. මං ඔහේට හොඳටම දෙහි කපනවා.

''අප්පුහාමි කව්රු හරි එක්ක කතා කරන කොට මං එතෙන්ට එන එක වැරදියි. මට ඒක මෙච්චර කල් තේරුනේ නෑ. අප්පුහාමි නිකංවත් මට ඒක කිව්වෙ....''

''ඕන්න ඔන්න ඔහේ පට වරද්ද ගත්තා. මට මෙච්චර කාලෙකට ඔහේගෙං එහෙම ප්‍රස්නයක් වෙලා නෑ. ගෙදර කව්රුවත් ආවාම ඔහේගේ මුල්ලට වෙලා හිටියාම ඒ මිනිසුසු මොනවාද හිතන්නෙ? ඒ මිනිස්සුත් එක්ක කතා බහ කරන එක, ඒ මිනිස්සුන්ට තේ කෝප්පෙකිං සංගරහ කරන එක ඔහේ නැතුව වෙන කව්ද කරන්නෙ. ඔහේ එතන ලැග ගෙන ඉඳං අපේ කතාවට බාදා කරන්නෑනේ ෟ ං ආ.... මට මතක නැති උනා. මං කිව්වා නේ දැම්ම ඉදලාම කව්රු හරි කැන්දං එනවයි කියලා. මං එයාට කියලා ඔහේ කරපු වැඩ ටික කර ගන්නං කො''
''අනේ සාදු'' ■



# ළමයි මල් වගෙයි

සමහර මව්වරු තමන්ට තිබෙන වැඩ පල නිසා තම දරුවන්ගේ අහිංසක සිත් වල ඇති මල් වැනි සිතුවිලි තලා පෙලා දමන අවස්ථා එමටය. සිතට ඇතිවූ එවන් සුළු තැල්මක් නිසා ඒ පොඩි සිතට සමහර විට එය මුළු ජීවිත කාලය තුලම අමතක නොවන සිද්ධියක් වී ඒ හේතුවෙන් මානසික වශයෙන් බොහෝ විට පසු බෑම් වලට පත් වන්නට පුළුවන.

මේ එක් සත්‍ය කතාවකි

එක් මවක් තම දියණිය තමාගේ බඩු බාහිරාදිය අවුස් සනවා දැක "හා හා දුව මගේ බඩු අවුස්සන්න එපා ඔය තෑගි ඔතන රත්තරං පාට කොලය ගන්න එපා මම හොඳ තෑග්ගක් ඔතන්නයි ඒක තියල කියෙන්නේ ගන්නෙ එහෙම නැහැ ඇල්ලුවොත් බලාගෙනයි" කියා තරවටු කලා.

දියණිය ඒ වන විට තෑගි ඔතන කොලයෙන් කෑල්ලක් ඉරා ගෙන ඉවරයි. ඇය පොඩි ලස්සන පෙට්ටියක් අර තෑගි ඔතන කොලයෙන් ඔතා ඊට පසු දින අම්මාට ගෙනැවිත් දුන්නා.

එවිට අම්මා "බලන්න දුව ඔයා මං කියන දේ ඇහැව්වෙ නැහැ නේද? මේ ළමය නම් හරිම නරක ළමයෙක් කියන දෙයක් අහන්නෙම නැහැ බලන්න මගේ බඩු නාස්ති කරන හැටි මම ඔයාට හොඳ පාඩමක් උගන්වන්නම් තවත් එහෙම අල්ලන්නෙ නැහැ මගේ බඩු යනව යන්න මෙතනින්" කීවා

දරුවාගේ ඇස් දෙකෙන් කඳුළු බිඳු දෙකක් බිමට රූරා වැටුනා

ඒ කඳුළු තුලින් "මම අම්මාට තෑග්ගක් ගෙනාවා" කියා අර ලස්සනට එතූ පොඩි පෙට්ටිය ඇයට දුන්නා.

අම්මා එය කඩා බැලුවා "මොකක්ද? මේ හිස් පෙට්ටියක් නේ" කියා ඇය තරහින් එය වීසි කොට දැම්මා. නමුත් දරුවා එය රැගෙන දුවගෙන විත් "අනේ අම්මේ මේ පෙට්ටිය ඇතුලට මම හාදු 100 ක් දැම්මා ඒකට මට ගොඩාක් වෙලා ගියා. අනේ අම්මේ මේ පෙට්ටිය වීසිකරන්න එපා ඒ සේරම මම අම්මට ආදරේට දාපු හාදු" කියා ඇය ඇඬුවා

අම්මට දුක හිතුනා ඇය ලඟ දන ගසා බදාගෙන ඇයව සිඹ සනසා සුරතල් කලා.

කෙසේ හෝ මාස ගනනකට පසු එම දරුවා අනතුරක් වී මෙලොවින් සමුගත්තා. අර අම්මා එම දරුවාගේ ඇඳේ ඉහ ඉද්දර අර හාදු පෙට්ටිය තබා දිනකට වරක් දෙවරක් එය රැගෙන අඬමින් හාදුවක් දෙකක් අරගෙන වසා තබනවා.ඇයට යම් කිසි ප්‍රශ්නයක් පැමිනි විට ඇය එම හාදු පෙට්ටිය ඇර හාදුවක් ගෙන එය වසන විට කඳුලක් එම පෙට්ටිය තුලට වැටෙනවා. මවගේ හිත වාවන්නේ නැති අවස්ථාවලදී ඇය ඉතා අසරණ වෙනවා.

දරුවාගේ චූටි සිත තලපු හැටි බැනපු හැටි මතක් වන විට ඇයට දිවි නැති කරගන්න පවා සිතුන වාර අනන්තය.

ළමයි මල් වගෙයි එම මල් නොතලා දරුවන් වැරදි කරන විට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ඉතා ප්‍රවේශමෙන් ඒවා හරිගස්සා ගත යුතුය. තොටිල්ල පදවන හස්තය ලොව ආන්ඩුකෙරේ යන කියමන මෙන් ගැහැණිය ගෙදර අම්මා ඉතා හික්මුන මැදිහත් සිතකින් ඉවසිලිවන්ත ඉතා බුද්ධිමත් තීරන ගන්නා නම්‍යශීලි කෙනෙක් විය යුතුය.

**නිර්මලී දිලීපා වික්‍රමනායක**
මෙල්බර්න් නුවර සිට.